A

ශ්‍රී ලංකා ජනාධිපති
இலங்கை சனாதிபதி
**President of Sri Lanka**

මගේ අංකය : පීඑස්/සීඑස්ඒ/00/4/4/2

2023 ඔක්තෝබර් මස 13 වන දින

ගරු මහින්ද යාපා අබේවර්ධන මැතිතුමා
කථානායක
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

ගරු කථානායකතුමනි,

**(358 වැනි අධිකාරය වූ) නාවික හමුදා පනත**

(358 වැනි අධිකාරය වූ) නාවික හමුදා පනතේ 21 වැනි වගන්තියෙන් මා වෙත පැවරුණු බලතල ප්‍රකාරව, ජාතික අභිවෘද්ධිය සඳහා වන අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින්, ශ්‍රී ලංකා නාවික හමුදාවේ ජල විද්‍යාව සහ නාවික සිතියම් විද්‍යාව පිළිබඳ විශේෂඥතාවය ඇති සාමාජිකයන්ට, 1971 අංක 52 දරන වෙළඳ නැව් පනතේ 321 වන වගන්තිය යටතේ සාදන ලද සහ 2022 ජනවාරි මස 06 වැනි දින අංක 2261/54 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රයේ පළකරන ලද 2021 අංක 06 දරන වෙළඳ නැව් (යාත්‍රා කිරීමේ සුරක්ෂිත බව) නියෝගයන්හි සහ 1981 අංක 54 දරන ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජ්‍යායතන පනතේ 4 වන වගන්තියේ (ඉ) පරිච්ඡේදයේ විධිවිධාන සලසා ඇති නාවික නොවන රාජකාරි ලෙස එකී ජල විද්‍යාත්මක ක්‍රියාකාරකම් ඉටු කිරීම සඳහා ආඥාවක් නිකුත් කොට ඇත.

ඒ අනුව, උක්ත පනතේ 21 වැනි වගන්තිය ප්‍රකාරව ඒ බව පාර්ලිමේන්තුව වෙත මෙයින් දැනුම් දෙමි.

මෙයට - හිතවත්

රනිල් වික්‍රමසිංහ
ජනාධිපති